මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 02/2014

මගේ අංකය:-CPC/PSC/5/
මධ්‍යම පළාත් සභාවේ
රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
අංක: 244, කටුගස්තොට පාර,
මහනුවර.
2014.09.23වැනි දින

මධ්‍යම පළාතේ
ප්‍රධාන ලේකම්,
ආණ්ඩුකාර ලේකම්,
සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්,
සියළුම ආයතන හා දෙපාර්තමේන්තු ප්‍රධානීන් වෙත.

**මධ්‍යම පළාත් රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ සේවා ව්‍යවස්ථාව අනුව දෙවන භාෂා අවශ්‍යතාවය සම්පූර්ණ කිරීම සඳහා කඩඉරටත් සහන සැලසීම**

---

2014.08.20 දිනැතිව නිකුත් කර ඇති ඒකාබද්ධ සේවා චක්‍රලේඛ අංක 03/2014 හි විධිවිධාන මධ්‍යම පළාත් රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ නිලධාරීන්ට අදාළ කරගැනීම මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කර ඇත. ඒ අනුව, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1705/2 හා 2011 මැයි මස 09 දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද මධ්‍යම පළාත් රාජ්‍ය කළමනාකරණ සහකාර සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ සංශෝධන අංක 03 හි සඳහන් 14:3:4 වගන්තියේ (ඇ) උපවගන්තිය කෙරෙහි ඔබගේ අවධානය යොමු කරවන අතර එම වගන්තිය මගින් මධ්‍යම පළාත් රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ II වන පංතියේ නිලධාරීන්ට දෙවන කාර්යක්ෂමතා කඩඉම සඳහා ලබාදී ඇති සහන කාලය, 2012.06.30 දින සිට 2013.04.02 දින දක්වා දීර්ඝ කෙරේ.

02. ඒ අනුව 2013.04.02 දින දක්වා මධ්‍යම පළාත් රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ II වන පංතියේ සියළුම නිලධාරීන්ට දෙවන භාෂා අවශ්‍යතාවය සම්පූර්ණ කිරීමකින් තොරව ස්වකීය වැටුප් වර්ධක උපයා ගැනීමට සහ නියමිත උසස්වීම් ලබාගැනීමට අවස්ථාව හිමිවේ.

03. මෙම චක්‍රලේඛයේ අඩංගු විධිවිධාන ඔබ අමාත්‍යාංශයේ / දෙපාර්තමේන්තුවේ / ආයතනයේ ඒ සඳහා සුදුසුකම් ලබන සියළුම නිලධාරීන්ට දැනගැනීමට සැලැස්විය යුතුය.

ආර්.එම්.එන්.රත්නායක,
ලේකම්
මධ්‍යම පළාත් සභාවේ
රාජ්‍ය සේවා කොමිෂන් සභාව